අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

093

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................
(මුල් කුරු සමග නිවැරදි ව ලියන්න)

02. විද්‍යාලේ නම සහ ලිපිනය : ..................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු/201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..........................................................................

05. පළාත : ..........................................................................

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

6 ශ්‍රේණිය

කාලය පැය 02යි.

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

I කොටස

01. (අ) "පිනි වැටිලා සිසිල දූනේ" යන වැකිය පද මාරු කරමින් මෙසේ ලිවිය හැකි ය.

(i) වැටිලා පිනි සිසිල දූනේ
(ii) සිසිල දූනේ පිනි වැටිලා
(iii) දූනේ සිසිල පිනි වැටිලා
(iv) පිනි වැටිලා දූනේ සිසිල

මෙය ආදර්ශයට ගෙන, අර්ථයට බාධාවක් නොවන ලෙස, ඉන් එක් ආකාරයකට පහත දැක්වෙන වැකි, පද මාරු කරමින් ලියන්න.

(i) තුරු මත නිති සැප විඳ.
(ii) මල් පිපිලා සුවඳ හමයි.
(iii) තුරුපත් සුළඟට සෙළවෙයි.
(iv) ගලන ජලේ මිහිර මැවේ.
(v) ගුණ නැණ සපිරුණු දරුවනි.

(ලකුණු 05)

(ආ) පහත පැදි පෙළ කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මල් සුවඳක් වෙලා අරුණට ගෙට වඩින
කඳුළට මුවා වී හිනැහෙන සඳ කිරණ
පින්බර අතින් මැළවෙන හිත් පිරිමදින
නාත්තා නුඹයි මතු බුදුබව ලබන

(ii) අවපස ලොවේ සුත් වුණු මුදු සිහින නෙළා
අපෙ හිත සතපවා දහඩිය කඳුළු සලා
දල්ලන පැතුම් රන් අස්වනු මවනු බලා
නුඹ හිනැහේවි පුරපස සුබ ලකුණ වෙලා

(iii) දිය කඳුරක් වෙලා ගිනිගත් හිත නිවන
බෝ සෙවණක් වගේ මුදු සීසිලය සදන
තරු එළියක්ව කළුවර අහසේ පිපුණ
නුඹ සුවඳක්ය පරසතු මල්වල රැඳුණ!

(i) මෙම පැදිපෙළෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද? (ලකුණු 01)

(ii) ''අපෙ හිත සතපවා දහඩිය කඳුළු සලා'' යනුවෙන් ප්‍රකාශ කරන්නේ කුමක්ද ? (ලකුණු 02)

(iii) කවි පෙළේ සඳහන් උපමාවක් උපුටා දක්වන්න. (ලකුණු 02)

02. (අ) දී ඇති නිදසුන සැලකිල්ලට ගෙන, එළිසම වදන් යොදා පහත කොටුවේ හිස්තැන් පුරවන්න.

නිදසුන

| අතර | නිතර | කතර | සතර | පතර |
|---|---|---|---|---|
| 1. උදාන | | | | |
| 2. අහස | | | | |
| 3. විලස | | | | |
| 4. විමන | | | | |
| 5. තලය | | | | |

(ලකුණු 05)

(ආ) (i) පහත දැක්වෙන කවියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

නමින් පට බැන්දත්
රනින් රුවනින් දිලුණත්
කුලෙන් රජ වුවත්
එයින් ඵල කිම සිරිත් හැරියොත්

(ලකුණු 02)

(ii) මෙම වචනවල අර්ථය ලියන්න.

(i) පට බැන්දත්
(ii) රුවනින්
(iii) ඵල කිම

(ලකුණු 03)

03. පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු සපයන්න.

(i) කැඩුණු පුටු මේස එක්කොට පංතියක
තවත් දිරාපත් වන්නට හරින එක
හරිද මගෙ පුතේ පවසම් විපත දැක
යළිත් පිළිසකර කොට ගනිමුද දිනෙක

(ii) අලි රංචුවක් රූපානේ ඇවිල්ලා
ගොවිපළ වටේ වැට ඉනි ඇත කඩාලා
හව බෝගත් බිමටම සමතලා වෙලා
ගොවියගෙ දුකට පිළියම් කිම සොයනු බලා

(iii) වැසි නැත වියළිණි ගොඩමඩ බෝග
ඇති විය පෙර නොව දුටු විරු රෝග
සාගිනි විපතක් ඇතිවිය වේග
නැතිද නසන මග ජන ආවේග

(iv) බහින ඉරේ රැස් දහරේ
ගලන දොළේ මල් ඉතිරේ
නගන රැලේ පිනි අහරේ
රඟනු ඔබත් සතුට පිරේ

(v) රජරට පොළොව ම හරි සරු සාරයි
කෙත් වතු රන්වන් පැහැයෙන් මෝරයි
වතුපිටි අටුකොටු ධනයෙන් ආරයි
කවියක් ලියන්න ඔබ හට බාරයි (ලකුණු 10)

04. (අ) පහත දැක්වෙන සිවුපද කාව්‍යවල හිස්තැන් වීරිත නොකැඩෙන සේ සම්පූර්ණ කරන්න.

(i) නිල් පලසක් වාගේ (මාත්‍රා 10)

මල් පිපිලා රහසේ (මාත්‍රා 10)

.............................. (මාත්‍රා 10)

.............................. (මාත්‍රා 10)

(ii) මඩින් උපන් නෙළුම් මලේ (මාත්‍රා 12)

.............................................. (මාත්‍රා 12)

පෙති විහිදා ඉහළ ගියේ (මාත්‍රා 12)

.............................................. (මාත්‍රා 12) (ලකුණු 06)

(ආ) පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිපේ නෙලුම් ඕලු ගඟේ විලේ ඇලේ
තිබේ වලාකුළු පහ වී නිලේ වෙලේ
නොපේන තෙක් ඈත මඟුල් ගෙයක් වගේ
සැදී සිටින්නේ ද ගසුත් වැලුත් ගලුත්

පිපී ගියා වූ ගන මුකලත් කැලේ
මලේ කොළේ පාට මෙසේ මෙසේ වෙතී
නෙලුම් කුමාරීට කියන්නවුන් වගේ
විලේ පියාඹත් බමරෝ රුරුං ගගා

ශබ්ද රසය තියුණු කිරීමෙහිලා කවීන් විසින් නොයෙක් අලංකාර භාවිත කරනු ලැබේ. අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුන පුනා කීම අනුප්‍රාසය වේ.

යම් කිසි වස්තුවක් තවත් වස්තුවකට සමාන කොට දැක්වීම උපමා නම් වේ.

(i) ඉහත පද්‍යයෙහි අනුප්‍රාස පද දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 02)

(ii) ඉහත පද්‍යවල උපමාවක් උපුටා දක්වන්න. (ලකුණු 01)

(iii) නෙලුම් කුමාරීට වනයේ සුන්දරත්වය පවසන්නේ කවුරුන් ද? (ලකුණු 01)

05. පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර, ඔබේ සිතේ මැවෙන සංකල්ප ඇසුරෙන් කැමති විරිතක් අනුව සිවුපද 08කට නො අඩු පැදිපෙළක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.



(ලකුණු 10)

## II කොටස

01. (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරා ගෙන පද්‍ය අටකට නොඅඩු නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i) පොකුරු පොකුරු මල් පීදෙන ලියවැලකි
කැකුළු පිපෙන තරු යායකි රළ පෙළකි

(ii) උඩරට මැණිකෙට
පටකුඩ දෙක දෙක
දුම්රිය යනකොට
කඳුහෙල් පහුකොට

(iii) උකුළුතලේ ඔංචිල්ලේ වැනෙන බබා
මුකුළු මුවේ මල් හසරැල් පාන පබා

(iv) පිනිපොද වැටුණු තණ මත මල් පිපුණු ගම
උදයේ රිදී එළියේ ඇස අරින බිම

(V) කුන්දු පැනල නැටුවෙත් අපි
වච්චි කියලා දිව්වෙත් අපි
හරිම වැඩේ අද ළමයින්
ඒව නොදන්නා

(ලකුණු 50)

(ආ) (i) " මට සමනලයෙකු වීමට හැකි වුණොත්" යන මාතෘකාව අනුව පැදිපෙළක් ලියන්න.

*නැතහොත්*

(ii) ''සත්ව අවිහිංසාව'' පිළිබඳ ව ඔබ දහම් පාසල් සාහිත්‍ය සමිතියේ දී කරන කවි කථාව ලියන්න.

(ලකුණු 50)

093

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023**

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..............................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ..............................

03. පාසල් වර්ගය : 200ට අඩු/201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..............................

05. පළාත : ..............................

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02යි.**

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

I කොටස

01. (අ) "මලක සුවඳ දසත හමයි" යන වැකිය පද මාරු කොට මෙසේ ලිවීමට හැකි ය.

1. දසත සුවඳ හමයි මලක
2. හමයි සුවඳ මලක දසත
3. දසත හමයි මලක සුවඳ
4. හමයි දසත මලක සුවඳ

මෙය ආදර්ශයට ගෙන, අර්ථයට බාධාවක් නොවන ලෙස ඉන් එක් ආකාරයකට පහත දැක්වෙන වැකි, පද මාරු කරමින් ලියන්න.

(i) සඳ පායා සිසිල ගලා
(ii) දෙමවුපියෝ අප සුරකිති
(iii) ගොවියෝ කෙත්වතු පුරවති
(iv) අහස උසට අපි නැග යමු
(v) අඳුර බිඳී පහන් සිලක්
(vi) පහන නිවී අඳුර ගලයි
(vii) පොත් කියවති නැණැති දනෝ
(viii) සඳ සුදිලෙයි ආකාසේ
(ix) මුනිවර බණ සිත පහදයි
(x) ළමෝ තුටින් ගීත ගයති

(ලකුණු 1/2 x 10 = 05)

(ආ) පහත ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශබ්ද රසය තියුණු කිරීමෙහිලා කවීන් විසින් බෙහෙවින් භාවිත කරන්නා වූ අලංකාර කිහිපයකි. අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් හෝ පුන පුනා කීම අනුප්‍රාසය නම් වේ.

කවියක එක් එක් පදයෙහි, මුල, මැද අග යන තන්හි හෝ ඉන් එක තැනක හෝ සමාන අකුරු යෙදීම එළිසමය නම් වේ. පොළට සිට වූ වැටක් මෙන් පෙනෙන හෙයින් මෙය එළිවැට නමින් ද හැඳින්වේ.

ඇස ඇස රස අඳුන්
දුක දුක රුසිරු මුනිඳුන්
මෙත සිත තුළ නුඳුන්
අහෝ බල බලව දොස් පුහුදුන්

(i) "එළිවැට" යන්නට තවත් යෙදුමක් ලියන්න (ලකුණු 01)

(ii) ඉහත දක්වා ඇති කවියෙන් අනුප්‍රාස කියැවෙන පද්‍ය පාද දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 02)

(iii) ඉහත දක්වා ඇති කවියෙන් එළිවැට දක්වෙන පද්‍ය පාද උපුටා දක්වන්න. (ලකුණු 02)

02. දී ඇති නිදසුන් සැලකිල්ලට ගෙන එළිසම වදන් යොදා පහත වගුවේ හිස්තැන් පුරවන්න.

නිදසුන:

| දුවන | ගුවන | නිවන | දවන | හවන |
|---|---|---|---|---|
| රසය | | | | |
| පවස | | | | |
| බලන | | | | |
| සසර | | | | |
| තමර | | | | |
| දල්ල | | | | |
| බලන | | | | |
| සතර | | | | |
| සුරස | | | | |
| නගන | | | | |

(ලකුණු 10)

03. පහත සඳහන් පැදි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වෙරළු ගෙඩිය හරි අටකට කපා ගෙන
කොටහක් නොකා දෙගුරුන්ටත් තබා ගෙන
උන් අපි එද සත් කුළු පව් පිලාසෙන
පැල ඉනි වැටට ඇයි අද ඇන කොටා ගෙන

පොඩි උන් දෙහෙ මල් මතකය ඉරා ගෙන
හොඳ හිත ගිහින් උඩු හුළඟට ගසා ගෙන
මහගෙයි බිමට තනි උරුමය කියා ගෙන
සතුරන් වෙලා උනුනට දෙස් තියා ගෙන

(i). මෙම පවුලේ දරුවන් කී දෙනෙක් සිටියෝ ද?

(ii). මෙහි දක්වෙන උපමාවක් ලියා දක්වන්න.

(iii). "කුඩා කාලයේ "යන අරුත දෙන යෙදුම උපුටා ලියන්න.

(iv). දරුවන් වැඩිමහල් වූ විට අසමගි වී ඇත්තේ කුමක් සඳහා ද?

(v). කුඩා කාලයේ දරුවන්ගේ හොඳ හිතට දුන් සිද වී ඇත්තේ කුමක් ද? (ලකුණු 10)

විරිත් නොකැඩෙන සේ පහත දැක්වෙන සිවුපද පද්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) දුටු විට පුර හඳ අගේ (මාත්‍රා 11)

........................................ (මාත්‍රා 11)

හිතට මගේ කවි නැගේ (මාත්‍රා 11)

........................................ (මාත්‍රා 11)

(ii) ........................................ (මාත්‍රා 12)

ඇළ දොළ දිය එකතුවෙලා (මාත්‍රා 12)

ගඟක් ගලයි සයුර බලා (මාත්‍රා 12)

........................................ (මාත්‍රා 12) (ලකුණු 04)

(ආ) පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් පිළිතුරු ලියන්න.


(i) කුරුළු පැටව්
හඬ තලමින්
හොට දිගු කර
ඇයි බලමින්

(ii) වැව් බැඳි මේ රජ රටයි
කෙත්වතු දිලි ගම රටයි
දකින ඔබේ සිහිවිලි ගොනු
ලිව්වොත් මෙහි හරි අගෙයි

(iii) සොම්නස පිරි මිහිරි ලොවක්
සාමය පිරි සමගි රටක්
සිනහව පිරි මියුරු වතක්
අගෙයි නේද සුපැති දැයක්

**( ලකුණු 02x3 =06)**

05. **පහත දැක්වෙන පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඔබේ සිතේ මතුවන අදහස් පද්‍ය අටකට නොඅඩු පැදි පෙළකින් නිර්මාණය කරන්න.** සුදුසු මාතෘකාවක් ද යොදන්න.



## II කොටස

01. (අ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරා ගෙන පද අටකට නොඅඩු නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i)
නිවාඩු කාලේ    බලා
නිදහස ලැබ සැරි    සරා
පොතින් පතින්    ඉගිලීලා
පියඹා යමු රට    වටා

(ii)
ගුණ නැණ    වඩවන
සිසු හද    දිනවන
ගුරුතුම ඔබ    ගුණ
සැමරේ හැම    දින

(iii)
ගමන බිමන    පහසුවෙන්
අධිවේගෙ යයි    සැණෙකින්
අනතුරු බොහෝ වේය    දූන්
වැළකිය හැකි කෙළෙස    ඉන්

(iv)
මහ මුහුදක් වැනි    අම්මා
සඳ මෙන් බබලන    අම්මා
රන් සමනල ගිරි    මුදුනේ
සිරිපා පද්මය    අම්මා

(v)
සැඩ සුළඟයි අකුණු    ගසයි
වැහි ඇද    හැලෙනා
අඳුර ගලයි මම    තනියම
මට බය    හිතුණා

(ලකුණු 50)

(ආ) (i) ඔබ අහසේ සරන තුරුල්ලෙකු යැයි සිතා ඔබට හැඟෙන දේ කවියට නගන්න.

*නැතහොත්*

(ii) පාසල් පරිසර සංවිධානයේ සභාපති ඔබ යැයි සිතා පාසල් රුක් රෝපණ උත්සවයේ දී ඔබ එහි පිරිස අමතා සිදු කරන කවි කතාව ලියන්න.

(ලකුණු 50)

093

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය
සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය-2023
පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ....................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ...........................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු/201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..................................................................

05. පළාත : ....................................................................

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

8 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　　　　　　　කාලය පැය 02යි.

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

### I කොටස

01. "අරුණලු දසතම පැතිරෙයි" යන වැකිය පද මාරු කොට මෙසේ ලිවිය හැකි ය.

1. දසතම අරුණලු පැතිරෙයි
2. පැතිරෙයි දසතම අරුණලු
3. අරුණලු පැතිරෙයි දසතම
4. පැතිරෙයි අරුණලු දසතම

ඉහත දක්වෙන නිදසුන ආදර්ශයට ගෙන පහත වැකි ඉන් එක් ආකාරයකට පද මාරු කරමින් ලියන්න.

(i) සවන පිනන ගීත ඇසෙයි
(ii) සිසිලස හදවත තවරයි
(iii) සිහිනෙන් පොඩි පුතු හිනැහෙයි
(iv) කැළේ ගසක මල් පිපිලා
(v) රත් පැහැයෙන් ගුවන දිලෙයි
(vi) උදේ හවස වැඩට යනෙන
(vii) මද පවනේ සුවඳ හමයි
(viii) සෙත් වේවා ගෙවී අපල
(ix) සවන පිනන ගීත ඇසෙයි
(x) මිහිරි වදන් සිත සනසයි

(ලකුණු 10 යි)

02. පහත දැක්වෙන පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

හිමි ඔබ සයුර මැද රුදු සටනක ය　　ඇයේ
පොල් අතු පැලේ මම තනියම වෙසෙමි　　බියේ
ඇනිමුත් හුරු පුරුදු එඩිතර ගතිය　　ළයේ
තරමක සැකයකිනි ඔබ අද සවස　　ගියේ

හබලට ඔබේ සවිබල අත　　රිදෙනවද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ　　නගිනවද
සීතල සුළඟ රළුවට ඇඟ　　වැදෙනවද
හිමියනි වෙහෙස නිදි මත දෙක　　දැනෙනවද

(i) මෙහි දැක්වෙන ස්වාමි පුරුෂයා කුමන රැකියාවක නිරත වෙයි ද ?
(ii) මෙහි 'ශක්තිමත්' යන අරුත දෙන පදයක් උපුටා ලියන්න.
(iii) සයුර මැද රුදු සටනක් කිරීමට හේතු වී ඇත්තේ කුමන හේතු නිසා ද ?
(iv) සැමියාට පීඩා දෙන දුෂ්කරතා දෙකක් මෙහි දක්වා ඇත. ඒ මොනවා ද?
(v) අකුරක් හෝ ශබ්දයක් හෝ පදයක් පුන පුනා කීම අනුප්‍රාසය නම් වේ. ඒ සඳහා උදාහරණයක් දෙවන කවියෙන් උපුටා ලියන්න. (ලකුණු 2x5 =10)

03. (අ) පහත ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

කාව්‍යය යනු කුමක්දැයි මැනවින් වටහා ගැනීම සඳහා පළමුව භාෂාව මගින් කෙරෙන කාර්යය අවබෝධ කරගත යුතු ය. චිත්‍ර කලාවේ මාධ්‍යය වර්ණ රේඛා හා හැඩතල වන අතර සංගීතයේ මාධ්‍යය ස්වර හා තාල ආදිය වෙයි. එලෙසම කාව්‍යයේ මාධ්‍යය භාෂාව යි.

භාෂාව එකිනෙකා අතර අන්‍යෝන්‍ය අදහස් හුවමාරුවට ද භාවිත වෙයි. එමෙන් ම භාෂාව යොදා ගෙන අප තුළ ඇතිවන හැඟීම් ද පළ කළ හැකි ය. කවියා තමන්ගේ හැඟීම් පාඨකයා තුළ තීව්‍ර ව ප්‍රකාශ කිරීමට භාෂාව සූර අන්දමින් භාවිත කරයි. ඒ සඳහා උපමා රූපක ආදි අර්ථ අලංකාරත්, තාලය වෘත්තයත් අනුප්‍රාසය වැනි ශබ්ද අලංකාරත් සංක්ෂිප්ත භාවයත් යොදා ගනී.

(i) කාව්‍යයේ මාධ්‍යය කුමක්ද ? (ලකුණු 02)
(ii) අදහස් හුවමාරු කිරීමට භාෂාව යොදා ගැනීමට වඩා කවියා භාෂාව භාවිත කරන්නේ කුමක් සඳහා ද ? (ලකුණු 02)
(iii) කවියා තම අභිප්‍රාය ඉටු කර ගැනීමට භාවිත කරන උපක්‍රම 2ක් මින් උපුටා දක්වන්න. (ලකුණු 02)

(ආ) මාත්‍රා සංඛ්‍යාව ගැන සැලකිලිමත් වෙමින් පද පූර්ණය කරන්න.

(i) යොදුන් ගණන් පසු කර ගෙන දුර ගෙවලා (මාත්‍රා 18)
දවස් ගෙවා ආ මග ඇත වෙනස් වෙලා (මාත්‍රා 18)
........................................................................ (මාත්‍රා 18)
........................................................................ (මාත්‍රා 18) (ලකුණු 02)

(ii) බිගු මෙන් මලට පැමිණෙන (මාත්‍රා 11)
බැතියෙන් අකුරු කරවන (මාත්‍රා 11)
........................................................ (මාත්‍රා 11)
........................................................ (මාත්‍රා 11) (ලකුණු 02)

## II කොටස

01. (අ), (ආ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරා ගෙන පද්‍ය අටකට නොඅඩු නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i)
වලාකුළෙන් බැසලා
වැස්ස ලෙසට වැටිලා
දිය ඇල්ලක එතිලා
ගලයි මුහුද සොයලා

(ii)
දිය රැළි සිනා නන්වයි වැව් දිය තලයේ
බබළයි සුදට සෑ බඳ සුදු සඳ එළියේ
බෝපත් සැලේ සෙත් පතමින් සිලි සිලියේ
නමදිති සැදැවත් දන සුදු වැලි තලයේ

(iii)
ඈත හිමේ බිත් තැන්නේ නුඹ ඉන්නා
මෑත ඉමට රැන් පිටින් ළං වෙන්නා

(iv)
තුරු හිස මල් දරනා
කොවුල් ගීත නැගෙනා
එරබදු රතඃ ඇදිනා
වසත් කුමරි වඩිනා

(v)
මහ පාරේ හරි කලබල වාහන ඈත පිරිලා
ඉවසා නොගියොත් කවුරුත් මහ මග ඇනහිටලා

(ලකුණු 50)

(ආ) (i) ජාත්‍යන්තර මලල ක්‍රීඩා තරඟවලින් ජයගත් ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් අමතා කෙරෙන ප්‍රශංසාත්මක කථාව කවියෙන් ලියන්න.

*නැතහොත්*

(ii) ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග රුධිර පීඩනය, හෘදයාබාධ, දියවැඩියාව විශාල වශයෙන් වාර්තා වෙයි. මෙම රෝගවලින් වැළකී සිටීමට හොඳ සෞඛ්‍ය පුරුදු ඇති කර ගන්නා ලෙස ඉල්ලමින් උදෑසන රැස්වීමේ දී ඔබ කරන කවි කථාව ලියන්න.

(ලකුණු 50)

අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

සිංහල භාෂා ඒකකය

093

## සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය- 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු/201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ..............................................................................

05. පළාත : ..............................................................................

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02යි.**

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

* පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.

* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

### I කොටස

01. පහත දැක්වෙන රූපකාලංකාර යෙදුම් උපමාලංකාර බවට හරවන්න.

| | |
|---|---|
| (i) හදවිල | (vi) මිණිපහන් |
| (ii) මීනනයන | (vii) ළැමහසුන් |
| (iii) දුකඳුර | (viii) මිහිලිය |
| (iv) අහස්ගඟ | (ix) නාදලුදෙතොල් |
| (v) මුවකුසුම | (x) දුක්ගිනි |

(ලකුණු 1 x 10 = 10 යි)

02. පහත දැක්වෙන කවි ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දීගෙන
පිඹ මොළවන විට ළිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න
දෑසේ නිල් පැහැය දැවී
සෙමෙන් තුරන් විය නොදැනිම

(i) දෑසේ නිල් පැහැය දැවී යාමට මෙහි දක්වා ඇති හේතුව කුමක් ද ?

විල් ජලයේ ගොහොරු මඩේ
සුදු රතු සියපත් පිපේ
අවලස්සන කොවුලු තුඩේ
පන්සිළු වෙණ නද නැගේ

(ii) තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථය පැහැදිලි කරන්න.

ලප සේ සඳවිලසේ දවසක් වෙන්නුවෙම්මා
එපසේ බුදු කෙනෙකුන් මෙන් රැකිදැයි නිතියෙම්මා

(iii) මෙහි දක්වෙන උපමා දෙක වෙන වෙනම ම ලියන්න.

මල් පිපෙනා පොකුණු ද
කඳු ගං කැලෑ කුඹුරු ද
වතු පිටි මිණි මුතු ද
තිබේ මගෙ රට කාට දෙවෙනි ද

(iv) මගෙ රට කිසිවෙකුට දෙවෙනි නොවීමට එහි ඇති විශේෂ ලක්‍ෂණ 4 ක් ඉහත කවියෙන් උපුටා දක්වන්න.

කෙලෙස් මල පිරි නුවර අතහැර
බවුන් වඩනට වනේ වැඩි ඔබ
සොයා ආවෙමි පොළෝ තලයේ
අනේ පිහිටක් නොමැති වූ විට

(v) මෙහි දැක්වෙන රූපකය කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

03. පද පූරණය කොට ලියන්න.

(i) පලතුරු එළවළු නිති අහරට ගෙන
ගත වෙහෙසා සෙල්ලමේ යෙදීමෙන
..........................................................................
..........................................................................

(ii) නොයෙක් රුවන් නිදිගත් මහ පොළොවේ
..........................................................................
..........................................................................
නොමැත මෙවන් සුරපුරයක් මෙලොවේ

(iii) අකුරට අපෙ හිත කැඳවන්නේ
කවි ගී රසයෙන් පිනවන්නේ
..........................................................................
..........................................................................

(iv) වියරුවෙන් හිරු රවයි මද්දහන් අහසේ
දිය සිඳුණු මරු කතර ගින්දරින් දිලිසේ
..........................................................................
..........................................................................

(v) බුදුගුණ අලංකාරය හා සුබාසිතේ

..........................................................................................

..........................................................................................

තවමත් දිවිය රසවත් වෙයි කලා කෙතේ

(ලකුණු 10)

04. පහත සඳහන් කවි පැනවලට අදාළ විරිතෙන් ම පිළිතුරු ලියන්න.

(i) අම්ම අතින් අල්ල ගෙන
පාට ඇඳුමකුත් ඇඳගෙන
පෙර පාසලෙ ගී ගයන්න
ඔබ ගිය හැටි මට කියන්න

(ii) අපූරු ලොවකට කැඳවා කතා කියා දෙන
පොත පත පිරිලා බලන්න තිබෙනා තැන තැන
තෝරා ගෙන එයින් පොතක් අදරින් කියවන
ඔබ ගුණ නැණ පිරි දරුවෙක් වෙනවා හෙට දින


(iii) පිපුණු මලක මල් සුවඳේ වෙළී ගෙන
මලක මිහිරි පැණි සොයමින් උරා බොන
බඹරු රැන් නිති ඇවිදින් කියා යන
රහස කියනවද උන්ගෙන් අසා ගෙන

(iv) සතුන් කුඩු කර ලබනා ඒ සතුට
යහපත් වෙයි ද ඔබ වැනි පොඩි දරුවෙකුට

(v) දේදුනු පාලම පසු කරලා
වලාකුළක් මත පා වීලා
තරු අතරින් ගිය රිංගාලා
සිහිනය ලියන්න රසකරලා

(ලකුණු 10)

05. පහත දක්වෙන චිත්‍රය නිරීක්ෂණය කොට ඔබේ සිතේ මැවෙන සංකල්පනා පද්‍යයට නඟන්න. (පද්‍ය 3 කට නොඅඩු විය යුතු ය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.)



(ලකුණු 10)

## II කොටස

01. (අ), (ආ) කොටසින් එක් කොටසක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක් කොටසක් හෝ තෝරා ගෙන පද්‍ය අටකට නොඅඩු නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i)
මහ ගල් කුළු දමනය වී
මිහි බට සුරපුරක් මැවී
සිතුවම් හා ගී ලියැවී
දෙව් පුරයක් සේ දිස් වී

(ii)
මගෙ ලස්සන නංගී ගේ
කොපුල් රෝස පෙති වාගේ
පැහැදිලි දිගු නෙතු ඇගේ
නිල්මිණි යුවලකැයි හැඟේ

(iii)
කහ සිවුර රැළි නගන
ඉවසිල්ලෙ මග වඩින
කළණ මිතු ගුණ දරන
බණ දෙසා අප නිවන

(iv)
නෙක මල් පිපී දසතෙහි සුවඳ ම ගලන
පස යට රන් රුවන් බෝ සම්පත් නිදන
සියුමැලි ගුණෙන් යුත් යහජනයා වසන
මේ මගෙ ලක්බිමයි මා නෙත් සේ රකින

(v)
මෙලොව පවතින්නේ
මිනිසුන්ට ම නොවන්නේ
ගහකොළ සතුන්නේ
උරුමයන් මෙහි බව සිතන්නේ

(ලකුණු 50)

(ආ) (i) ඔබ ගිය නටබුන් නගරයක අපූර්වත්වය මෙනෙහි කරමින් ඔබ සිතට ඇති වූ සිතුවිලි කවියට නගන්න.

*නැතහොත්*

(ii) "බෝවන රෝගවලින් වැළකෙමු" යන මැයෙන් සභාවක ඔබ විසින් කරනු ලබන කවි කථාව ලියා දක්වන්න.

(ලකුණු 50)

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

093

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................
(මුලකුරු සමග නිවැරදිව ලියන්න)
02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................
03. පාසල් වර්ගය : 200 තෙක් / 201-500 තෙක් /500ට වැඩි
04. කලාපය : ..........................................................................
05. පළාත : ..........................................................................

**10 ශ්‍රේණිය** **පද්‍ය නිර්මාණය හා අවබෝධය** **(කාලය පැය 02යි)**

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

## I කොටස

01. **පහත දැක්වෙන ඡේද ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(අ) සිංහල භාෂාවේ ස්වර හ්‍රස්ව, දීර්ඝ වශයෙන් කොටස් දෙකකට වෙන් කෙරේ. මේ සටහන තුළ වෙන් කොට දක්වා ඇති අකුරු එකිනෙක ශබ්ද කර වෙනස හඳුනා ගන්න.

| හ්‍රස්ව ස්වර | දීර්ඝ ස්වර |
|---|---|
| අ, ඇ, ඉ, උ, එ, ඔ | ආ, ඈ, ඊ, ඌ, ඒ, ඕ |

මේ සටහනේ දැක්වෙන ස්වර අතරින් හ්‍රස්ව කොටසට අයත් අකුරු ඇදිලා නොකියවෙයි. දීර්ඝ කොටසට අයත් අකුරු ඇදිලා කියවෙයි. එබැවින් ඇදිලා නොකියවෙන අකුරු හ්‍රස්ව ස්වර නමින් ද ඇදිලා කියවෙන අකුරු දීර්ඝ ස්වර නමින් ද ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි හැඳින්වෙයි.
හ්‍රස්ව ස්වරයක ඇත්තේ එක් මාත්‍රාවකි. දීර්ඝ ස්වරයක මාත්‍රා දෙකක් ඇත. හ්‍රස්ව අකුරු ලඝු, ලුහු යන වචනවලින් ද දීර්ඝ අකුරු ගුරු යන වචනයෙන් ද හැඳින්වෙයි.
මාත්‍රා එකක් ඇති අකුරක් ප්‍රස්තාර කොට දැක්වීමේදී - ලකුණත්, මාත්‍රා දෙකක් ඇති අකුරක් ප්‍රස්තාරකොට දක්වීමේදී U ලකුණක් යොදනු ලැබේ. මේ නිදසුන් බලා තවදුරටත් තේරුම් ගන්න.

— — —
කතිර
U U
මාලා
කතිර යන වචනයේ මාත්‍රා තුනකි. මාලා යන වචනයේ මාත්‍රා හතරකි.

ප්‍රශ්න

i. ඉහත දක්වා ඇති සටහනේ හ්‍රස්ව ස්වර කීයක් තිබේ ද? දීර්ඝ ස්වර කීයක් තිබේද?
ii. හ්‍රස්ව ස්වරයක මාත්‍රා කීයද? දීර්ඝ ස්වරයක මාත්‍රා කීයද?
iii. හ්‍රස්ව ස්වර හැඳින්වීමට යෙදිය හැකි වෙනත් වචන දෙකක් ලියන්න.
iv. දීර්ඝ ස්වර හැඳින්වීමේදී යොදා ගන්නා සලකුණ කුමක්ද?
v. "නිරාශා" යන වචනයේ ඇති මාත්‍රා සංඛ්‍යාව කීයද?

(ලකුණු 05 යි)

(ආ) වියත්හු සිය අදහස් රමණීය ලෙස පැවසීම සඳහා අලංකාර යොදති. මේ අතර උපමා අලංකාරය සහ රූපකාලංකාරය ගැඳි පැදි දෙකට ම අබරණකි. වගේ, බඳු, සේ, මෙන්, එව් ආදි සම්බන්ධ වාචක පදයක් සහිතව යොදා ඇත්තේ නම් එය උපමාලංකාරයයි. නිදසුන් කියවමු. "ඇගේ දෙනෙත් නිලුපුල් මල් වැනිය","ඒ පුරය සුරපුර මෙන් බබළන්නට විය". යම් උපමාවක් ඉහත කී නිපාතයන්ගේ සම්බන්ධතාව නොමැතිව ලියන ලද්දේ නම් එය රූපලංකාරයයි. "ඇගේ දෙනෙත් නිලුපුල්ය", "ඒ පුරය සුරපුරයකි." ආදී වශයෙන් ඒවා රූපක බවට පත් කර ගත හැකි ය.

එක් පාදයක මාත්‍රා දහඅට බැගින් ඇත්තේ සමුදුරු ගොස් විරිතටයි. එවැනි පද්‍යයක් ගායනයේ දී මාත්‍රා දහයෙන් අටෙන් යතිය තැබිය යුතු බවට නියමයක් ඇත. මෙය සමුද්‍රඝෝෂ වෘත්තය රැදි ඡන්දසට අයත් වෙයි. සිරි රහල් හිමියන් සැළලිහිණි සන්දේශය රචනා කළේ මෙම විරිතෙනි.

i. වියතුන් අලංකාර යොදන්නේ කුමක් සඳහා ද?
ii. "උපමාලංකාරය හඳුන්වන්න.
iii. රූපකාලංකාරය හඳුන්වන්න.
iv. මාත්‍රා දහඅටක් ඇත්තේ කුමන විරිතකට ද?
v. සැළලිහිණි සන්දේශය රචනා කළේ කව්ද?

(ලකුණු 05 යි)

02. පද පූරණය කොට ලියන්න.

(i) පැහැදිලි අත් අකුරු ලීවොත් විභාගෙට
පිළිතුරු කියවන්න පහසුයි නේ එවිට
.............................................................................
.............................................................................

(ii) බුදුන් උපන් ඒ පින් බිම ඇහෙන් දකින්නයි
දඹදිව් රට ගියේම ඇය පින් කරගන්නයි
.............................................................................
.............................................................................

(iii) බුලත් හුරුලු අත රැඳේවි
දෙගුරුන් සිත සතුටු වේවි
.............................................................................
.............................................................................

(iv) මිනිසුන් කළගුණ අමතක කරලා
මිනිසත් දම් අඳුරට ගොස් මැකිලා
.............................................................................
.............................................................................

(v) විදුලි කොටද්දී අකුණු ගහද්දී වතුර ගලාගෙන කොහි යන්නේ
වැස්ස වහිද්දී ගඟ උතුරද්දී ..........................................
මිදුල පිරෙද්දී වැහි වැඩි වෙද්දී ..........................................

(ලකුණු 10යි)

03. පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු සපයන්න.

(i) තව අවුරුදු සියකින් අඟහරු ලොවට
යනවලු මෙහෙ අය එහි ජීවත් වෙන්ට
පෝලිම දිගයි ඉල්ලුම්පත් ඇත එමට
කැමතිද ඔබත් යන්නට හනිකට එහෙට

(ii) මෙච්චර ලස්සනට පාටට නෙක		හැඩට
මල් පිබිදෙන්නෙ කෙලෙසද අපගේ		ලොවට
මඳ සුළඟට සැලෙයි ආසිරි ගෙන		අපට
කවියක් ලියන්නකො ඒ මල් ගැන		සුමට

(iii) කඳුකර පෙදෙස් වල
දිය ඇලි ගයන ගීවල
සැඟවුණු අරුත් පෙළ
කියන් සොබදම් මැණි පොබකළ

(iv) බිග්මැචි සැණකෙළි අද		අනතුරකි
මත් වතුරින් එය වැනසෙන		සෙයකි
දැක්කෙම විනයක් පිරිහෙන		බවකී
ඇත්ත නේද පාසලට		කැළලකී

(v) රට අතහැර යන අය දැන්		වැඩිලු
රැකියා වැඩි වැඩියෙන් එහි		ඇතිලු
ලක්මව දෙනෙතට ගලනව		කඳුළු
මේ ගැන ඔබෙ අදහස කිම		යහළු

(ලකුණු 10 යි)

04. පහත වැකිවල උපමා රූපක බවට හරවා ලියන්න.

(අ) උදා:- ඇගේ ස්නේහය විලක් බඳුය - සෙනේ විල

i. ඇගේ දෙතොල් නාදලු වැනිය.............................................................

ii. ඇගේ මුහුණ සඳක් බඳුය.............................................................

iii. සමිඳුගේ පාද පද්මයන් සේය.............................................................

iv. ලෝකය අම්බලමක් වැනිය. .............................................................

(ලකුණු 04 යි)

(ආ) මෙම කවි පදවල මාත්‍රා සංඛ්‍යාව ඉදිරියෙන් ඇති කොටුවේ ලියන්න.

(i) සෙත් සිරි දෙන මහ ගුණ		මුහුදාණන්
සත්හට වන බව් දුකට		වෙදාණන්

(ii) පෙරදිග ලෝකයේ බබළන		මුතුඇටය
පණ ඇති මහා සමුදුර පවුරෙන්		වටය

(iii) සිය පින් සිරින්		සරු
දෙතිස් ලකුණින්		විසිතුරු

(ලකුණු 06 යි)

5. පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කොට ඔබ සිතේ හට ගන්නා කාව්‍යමය සංකල්ප පද්‍ය දහයකින් පමණ ඉදිරිපත් කරන්න. සුදුසු මාතෘකාවක්ද යොදන්න.



(ලකුණු 10යි)

## II කොටස

01. පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසේ කොටස් දෙකින් එකක් හෝ තෝරා ගෙන පද්‍ය රචනයක් ලියන්න. පද්‍ය 10ට නොඅඩු විය යුතුය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i) පාට පාට මල්
සුවඳ සුවඳ මල්
අතර හොඳම මල්
කැලේ පිපෙන මල්

(ii) සීතල දිය දහර කඳු මුදුනින් වැටෙන
සිහිලස සදයි පිවිතුරු සුළඟින් හමන
වනමල් ගුලා සරසයි මිහිසුව ගෙනෙන
මේ ගම මගෙයි මට කවිකම කළ තිළිණ

(iii) අන්දරයායේ වැව් තාවුල්ලේ සක්මන් කරනා අප්පච්චී
දොළේ දියයි මට කෙතේ තිලයි ගහ වැලේ මලයි මට අප්පච්චී

(iv) නිදහස් හිරු දෙව් එනවා
දෑ බැතිමල් පිබිදෙනවා
සිරිලක් මව හිනැහෙනවා
මගේ පුතා නැළවෙනවා

(v) හිමි ඔබ සයුර මැද රුදු සටනකිය රැයේ
පොල් අතු පැලේ මම තනියම වෙසෙමි බියේ

(ආ) ඔබ වගා කළ ගෙවත්ත සරු ලෙස වැඩෙන අයුරු දකින ඔබේ සිතට පහළවන සිතිවිලි කවියට නඟන්න (පැදි 10 කට නොඅඩු)

*නැතහොත්*

"රෝහලක් තුළදී" යන මැයෙන් පැදි පෙළක් ලියන්න. (පැදි 10කට නොඅඩු)

(ලකුණු 50යි)

093

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විද්‍යාලයේ නම සහ ලිපිනය : .................................................................................

03. පාසල් වර්ගය : 200 තෙක් / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ..............................................................................

05. පළාත : ...............................................................................

---

11 ශ්‍රේණිය

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

(කාලය පැය 02යි)

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

01. පහත දැක්වෙන ඡේද ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) සිංහල කාව්‍ය රචනය ගැන ඉගෙන ගන්නා විට ව්‍යාකරණ ඡන්දස් හා අලංකාර යන ශාස්ත්‍ර සම්බන්ධයෙන් දැනුමක් ලබා තිබීම අවශ්‍ය වියරණ නොදන්නා අන්ධයෙකුට සමාන ය. සිංහල ව්‍යාකරණ ගැන ලියූ දැනට ශේෂව ඇති පැරණි ම පොත සිදත් සඟරාව යි. එහි කතුවරයා දඹදෙණි අවධියේ විසූ පතිරාජ දෙව් පිරුවන්පති හිමිනමකි. එම ග්‍රන්ථයෙන් පසුව ලියවුණ පොත් රාශියක් ඇත. පද නීතිය, සිංහල භාෂාව, ව්‍යාකරණ විවරණය, ව්‍යාකරණ ශික්ෂාව, සම්මත සිංහලය ව්‍යාකරණ රත්නාකරය ඒ අතර වෙයි. සිදතෙහි විසි විසිවැදෑරුම් වියරණ විධි ඇත.

අලංකාර නමින් සැලකෙන්නේ කියවන්නන්ගේ අසන්නන්ගේ සිත් බඳින ලෙස බස හසුරුවන හැටි උගන්වන ශාස්ත්‍රයයි. මෙම විෂය ගැන ලියවුණු දැනට ශේෂව ඇති පැරණිම ග්‍රන්ථය සියබස්ලකර යි. එය අනුරාධපුර යුගයට අයත් ය. කතුවරයා ශිලාමේඝවර්ණ රජතුමා ය. උපමා, රූපක, දීපක උත්ප්‍රේක්ෂා ආදී අලංකාර ක්‍රම තිස්පහක් සියබස්ලකරෙන් ඉගැන්වෙයි.

(i) කාව්‍ය රචකයෙකු විසින් උගත යුතු ශාස්ත්‍ර මොනවා ද ?
(ii) සිංහල ව්‍යාකරණ ගැන ලියවුණු පැරණි ම පොත කුමක් ද ?
(iii) එයින් පසු ලියවුණු තවත් පොත් දෙකක් නම් කරන්න.
(iv) සියබස්ලකරින් ඉගැන්වෙන විෂය කුමක් ද ?
(v) අලංකාර විධි හතරක් ලියන්න.

(ලකුණු 05 යි)

(ආ) පෙරදිග කාව්‍ය විචාරකයින් අතුරින් 'විශ්වනාථ' නම් විචාරකයා රසය ආත්ම කොට ගත් වාක්‍ය කාව්‍ය යැයි පවසයි. මෙහි යෙදුණු 'රසය' වියුක්ත සංකල්පයකි. එසේ පවසන්නේ රසය යන්න කුමක්දැයි විස්තර කිරීමට විග්‍රහ කිරීමට අසීරු බැවිනි. රසය වූ කලී තමන් ම විඳ අවබෝධ කරගත යුත්තකි. ජගන්නාථ නම් පෙරදිග කාව්‍ය විචාරකයා කවිය දකින්නේ "රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය" ලෙසිනි. එය කවිය පිළිබඳ අපූරු විග්‍රහයකි. මේ අනුව කවිය ගද්‍යමය වාර්තාවක ස්වරූපය නොගත යුතු අතර නිර්මාණය තුළින් මතුවන පණිවිඩය රමණීය වූවක් විය යුතු වෙයි.

බටහිර දිග කාව්‍ය විචාරක 'විලියම් වර්ඩ්ස්වර්ත්' කවිය දකින්නේ "බලවත් හැඟීම් නිරායාසයෙන් ගලායාමක්" වශයෙනි. මේ නිර්වචනය දෙස බැලීමේ දී ප්‍රතිභාව හා ව්‍යුත්පත්තිය යන කරුණු දෙක කවියෙකු සතුවිය යුතු වාසනා ගුණ වේ යන ඉගැන්වීම සිහිපත් වේ.

(i) කවිය පිළිබඳ විශ්වනාථගේ නිර්වචනය කුමක් ද ?
(ii) 'රසය' වියුක්ත සංකල්පයක් වන්නේ ඇයි ?
(iii) 'ජගන්නාථ' කවිය දකින්නේ කෙසේ ද ?
(iv) කවිය 'බලවත් හැඟීම් නිරායාසයෙන් ගලායාමක්' ලෙස දකින්නේ කවුද ?
(v) කවියකු සතුවිය යුතු වාසනා ගුණ මොනවා ද ?

(ලකුණු 05 යි)

02. පද පූරණය කොට ලියන්න.

(i) නෙත් සිත් පිනවන
සත් වග සනසන
මෙත් ගුණ......................
........................................

(ii) කඳුළු ගංගා
ගෙනෙයි හංගා
දුව..........................
................................

(iii) උදු ළහිරු හිනහෙනවා
විදු සතුට ගෙන එනවා
...........................................
...........................................

(iv) අරුණලු නැගෙයි තව දවසක් එළිය කොට
මදනල හමයි නිල්වන් කඳු මුදුනෙ සිට
..........................................................................
..........................................................................

(v) පහේ පන්තියේ දරුවෝ නැසෙති විභාගය හින්ද
කොහේ යනුද අපෙ මව්පියො 'සිස්සත්තයෙ' නම කැන්ද
..........................................................................................................
..........................................................................................................

(ලකුණු 10 යි)

03. මෙම කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු ලියන්න.

(i) දූ දරුවන් සිටියත් පඩි පෙළකට
අසරණ වෙනවලු ගියාම වයසට
මවුපිය උවටැන් හැම අමතක කොට
ඇයි මේ මිනිසුන් යන්නේ නිරයට

(ii) බට පතුරු කපා යස කූඩු තනා
හැඩ කොළ අලවා අපි සතුටු වුණා
දැන් එහෙම නෙවෙයි ළඟ කඩෙන් ගෙනා
කූඩුවක කොහිද ඒ සතුටු සිනා

(iii) සවසට රැට පාසල් ගොඩනැගිලි තුළ
වැඩිහිටි පන්ති කරමුද නැණ ගුණ අතුළ
ඔවුන් යහමගට ගත යුතු වේ මෙකල
දරුවන්ටත් සෙතක් වනු ඇත ඉන් නිමල

(iv) සාහිත සමිතිය බිත්ති පුවත්පත්
වාද විවාද නිවාස තරගයත්
චාරිකාව සිසු සතුට පුරෝගත්
පාසල තුළ ඇති දෝ ඔබෙ තවමත්

(v) බැඳ ගත් පෙම් දහම් යන විට කැඩෙන්නට
ගෙල වැල දමන්නට වස බී මැරෙන්නට
නැතිනම් වෙර දරති පිහියෙන් අනින්නට
කළ යුතු කිමද ඒ වැනි අනුවණ අයට

(ලකුණු 10 යි)

04. (අ) පහත දැක්වෙන පද්‍ය පාදයන්හි ඇති මාත්‍රා සංඛ්‍යාව ගණන් කර ඒ ඉදිරියෙන් ලියන්න.

(i) නපුරු කලට සතවෙත පැමිණෙන වෙහෙස ..................................................

(ii) විලක තඹරු සේ හසරැලි දෙනවා ..................................................

(iii) කය නම් අසාරය..................................................

(iv) අහෝ දෙව්දත් නොදිටි මොක්පුර..................................................

(v) බෑ ඉවසන්නට බෑ ඉවසන්නට අම්මෙනි පෙම්බර ලංකා ..................................................

(vi) ඉර පායා ඉර අවරට ගියා දෝ..................................................

(ලකුණු 06 යි)

(ආ) පහත දැක්වෙන රූපක උපමා බවට පත්කොට ලියන්න.

(i) නා දලු දෙතොල් - ..................................................


(ii) නිලුපුල් දිගු නෙත් - ..................................................

(iii) ආසා බැම්ම - ..................................................

(iv) පාද පද්ම - ..................................................

(ලකුණු 04යි)

05. පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කොට ඔබේ සිතේ හට ගන්නා කාව්‍යමය සංකල්ප පද්‍ය දහයකින් පමණ ඉදිරිපත් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.



(ලකුණු 10යි)

## II කොටස

01. පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසින් එකක් හෝ තෝරා ගෙන පද්‍ය රචනාවක් ලියන්න. පද්‍ය 10 ට නො අඩු විය යුතුය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i) අයියන්ඩියේ- පොඩි ද සිට අපි දෙන්නා
එක වහලක් යට වැලි කෙළිමින් උන්නා

(ii) සැඳෑ සමයයි ජීවිතේ - ගෙවන්නේ මා අද දිනේ
දෙපා වාරුව පමණකි අද - මගේ තනියට ළඟ සිටින්නේ

(iii) ගුණ දහමට කර සරදම් - පාමින් බහුරූ කෝලම්
අදහන විට ලොව අදහම් - පලදෙයි දවසක කළ කම්

(iv) වැඩූ මවත් ඔබ දිනූ බිමත් රැක ගන්න ඔබේ ඇස් දෙක වාගේ
එපා නමන්නට අයුක්තියට හිස යුතුකම සුරකිනු පණ වාගේ

(v) කරුණාව සමග හොඳ හිත පතුරන්න හැම කෙරේ
හැමදම ඉන්න පුළුවනි සතුටින්ම ලෝකයේ

(ආ) 'රිය අනතුරු ඇයි නිරතුරු' යන මැයෙන් පැදි පෙළක් ලියන්න. පැදි දහයකට නොඅඩු විය යුතු ය.

නැතහොත්

වෙරළ අබියස හිඳ සිටින ඔබ මහ සයුර අමතා කවි පෙළක් ලියන්න. පැදි දහයකට නොඅඩු විය යුතු ය. මාතෘකාවක් ද යොදන්න.

(ලකුණු 50 යි.)

0 8 ෆ

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

## සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
### පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..............................................................................................

(මුලකුරු සමග නිවැරදිව ලියන්න)

02. විදුහලේ නම සහ ලිපිනය : .................................................................................

03. පාසල් වර්ගය : 200 තෙක් / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ..............................................................................

05. පළාත : ..............................................................................

---

12/13 ශ්‍රේණි — **පද්‍ය නිර්මාණය හා අවබෝධය** — (කාලය පැය 02යි)

* පළමුවන කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* දෙවන කොටසේ (අ), (ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.
* ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

### I කොටස

01. පහත දැක්වෙන ඡේද ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) පද්‍ය රස වින්දනය හේතු කොට ගෙන පාඨකයන්ගේ සිතේ ඇතිවන විපර්යාසය කෙබඳුද? එම විපර්යාසය හඳුන්වන විශේෂ වචනයක් ඇත. එනම් චමත්කාරය යි. චමත්කාරය යනු සිත මත් කරන ගුණය පමණක් නොවේ. පද්‍ය කෘතියක් කියවීමෙන් පසුව එහි සඳහන් පෙර නොවූ විරූ දෙයක් පිළිබඳ ව විස්මයක් අප තුළ හට ගනී. චමත්කාරය නම් වනුයේ ඒ විස්මය යි. සියලු ම රසයන්ගේ හරය චමත්කාරය වෙතැයි කියන ලද්දේ එහෙයිනි. සාහිත්‍යය යන වචනයේ අර්ථය විස්තර කරන විචාරකයෝ "සාහිත්‍ය භාවං සාහිත්‍යම් - සහිත බවම සාහිත්‍ය වෙතැයි" කියති. සැකෙවින් කියතොත් සාහිත්‍යය යනු පාඨකයාගේ හදවත පෝෂණය කරන ධනයකි. උසස් සාහිත්‍ය කෘතියක් පරිශීලනය කිරීමෙන් ලබන ආස්වාදය හෙවත් රසය ආධ්‍යාත්මික වූ ප්‍රතිලාභයකි. මුළු මහත් ලෝක සාහිත්‍යයම ආධ්‍යාත්මික ධනයක් වන්නේ එකී අරුතිනි. උක්ත කරුණු ඇසුරෙන් වටහාගත යුතු මූලික කාරණය නම් කාව්‍යය පවතින්නේ වින්දනය සඳහාම බවය. දෙවැනි පැරකුම්බාවන් ස්වකීය මහා කාව්‍යය වන "කව්සිළුමිණ" අරඹන අයුරු ඊට නිදසුන්ය.

"සරසවිය බැලුම සෙක්නි - වෙත්වා කිවිදනෝ
පෙදෙහි රසහව් විඳුනා - දෙනෙතා ඉතා දුලබෝ"

සරසවියගේ බැලුම් මාත්‍රයකින් වුව කෙනෙකු කවියකු වනු ඇත. එහෙත් කවියෙහි රස භාව විඳින ජනතාව නම් දුලබය. ස්වකීය "කවි ශික්ෂාව" නැමැති කෘතියෙහි ලා මුනිදාස කුමාරතුංගයෝ මෙසේ කියති."යමක් කියවූ කල ඇසු කල විලිබිය ඇතියවුනට රසයක් දැනේ නම්" ඒ කවියකි.

(i) පද්‍ය රස විඳීමෙන් පාඨක සිතේ ඇතිවන විපර්යාසය හැඳින්වෙන වචනය කුමක්ද?
(ii) සාහිත්‍යය යන වචනය විස්තර කෙරෙන සංස්කෘත භාෂාමය වැකිය උපුටා දක්වන්න.
(iii) මෙහි දැක්වෙන සාහිත්‍යයෙන් ඉටුවන සුවිශේෂ කාර්යයක් දක්වන්න.
(iv) "කව්සිළුමිණ" කාගේ කෘතියක්ද?
(v) මෙහි දැක්වෙන මුනිදාස කුමාරතුංගයන් ලියූ කෘතිය කුමක්ද?

(ලකුණු 05යි)

(ආ) සම්භාව්‍ය පද්‍ය රචකයකු වීමට එම භාෂාවේ ව්‍යාකරණ, කෝෂ, ඡන්දස්, තර්ක යන විෂයයන් ගැන අවබෝධයක් ඇත්තෙක් විය යුතු ය. එක්තරා පඬිවරයෙක් "ඡන්දස් ශාස්ත්‍රය වනාහි ගැඹුරු වූ කාව්‍ය සාගරය එතෙර කරනු කැමැත්තන්ට නෞකාවක් බඳුය"යි කියයි.

ඈත අතීතයේ සිටම සංස්කෘත භාෂාවත් සමග ඡන්දස් ශාස්ත්‍රය උගත් අපේ සිංහලයෝ සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයටම වහල් නොවී අපේ බසට ගැළපෙන සඳැස් විරිත් සකසා ගත්හ. ගී, සිව්පද, දෙපද, සැහැලි ආදි වශයෙන් සංවර්ධනය වූ ඒ ඡන්දස්වලට අනුකූලව සිංහල පද්‍ය සාහිත්‍යය වැඩි දියුණු වූ බව පෙනේ. අනුරාධපුරයේ පටන් දඹදෙණි යුගය දක්වාම ගී කාව්‍ය සම්ප්‍රදය කෙරෙහි වැඩි සැලකිල්ලක් ලැබිණි. සියබස්ලකර, සීගිරි ගී, මුවදෙව්දාවත, සසදාවත, කව් සිළුමිණ, සිදත් සඟරාව, සඳැස් ලකුණ වැනි පද්‍ය සාහිත්‍යයට අයත් පැරණි පොත් සියල්ලම ලියැවී ඇත්තේ ගී කාව්‍ය සම්ප්‍රදාය අනුවය.

(i) සම්භාව්‍ය පද්‍ය රචකයකු වීමට ඉගෙනගත යතු භාෂා විෂයයන් නම් කරන්න.
(ii) එක් පඬිවරයකු මෙහිදී ඡන්දස් ශාස්ත්‍රය හඳුන්වා ඇත්තේ කෙසේද?
(iii) සිංහල කවීන් ඡන්දස් ශාස්ත්‍රය උගත්තේ කුමන බසකින්ද?
(iv) ඔවුන් සකසා ගත් අපට ගැළපෙන සඳැස් විරිත් 4ක් දක්වන්න.
(v) ගී කාව්‍ය සම්ප්‍රදාය අනුව ලියැවුනු කෘති 4ක් දක්වන්න.

(ලකුණු 05යි)

02. පහත දැක්වෙන පැදි පෙළ ගැන ඇගයීමක් කරන්න.

රූපවාහිනියක් ගෙදර වැඩ
දේසනාව මේසය උඩ
ගොළුවො බීරො වගෙ හැමෝම
නෙත් දල්වා බලනව හැඩ

හෝඩි පොතේ ජීවය නෑ
ගමේ පිපෙන මල් එහි නෑ
එරමිණියා මාදම් ගැන
කතා අනේ පිටුවල නෑ

ගෙමිදුලෙ කවි කී වැඩිහිටි
හැන්දෑවට දෙන හූ මිටි
හෙන්දිරික්ක පාට පාට
කතා අනේ කෝ රසහිටි

අත්තාපල් වරෝ වරෝ
ගහන්න මෙහි වරෝ වරෝ
සිඟිති හඬක් අහන්න කෝ
මොකද වුණේ වරෝ වරෝ

අඩි පාරේ කඳුළු වැටී
තැන තැන දිය කඩිති කැටී
අකුරු අහුළ ගන්නට අපි
ඇයි මෙතරම් දුකට වැටී

එන්න පුතේ වැවට යන්න
හෙට යමු පන්සල බලන්න
කිරි අම්මා දැක්කෙත් නෑ
කියන කතා කෝ අහන්න

මලක් පිපෙන කෝ පැළයක්
ගෙයි මිදුලම වල් කැළයක්
මී මැස්සන් දෙන නද නෑ
ඉතින් කොහිද පැණි කළයක්

ගණිත පන්තියට ගියාද
කෝ බලන්න ලකුණු කොහිද
ඇයි මෙතරම් අඩුව ගත්තේ
කොච්චර නුඹහට කීවද

එහා ගෙදර ඉන්දුමතී
පන්තියෙ මුල් තැන ගතී
උන්ගෙ ගෙදර කන්නත් නෑ
අකුරු දන්න කෙනෙකුත් නෑ

ගහන්නෙපා මගෙ අම්මේ
නිදිමත එනවා අම්මේ
කියන දෙයක් තේරෙන්නෑ
කඳුළු පිරෙනවා අම්මේ

දැනුම මෙහෙම දුන්නට මට
ජීවිතයට මදි වෙයි හෙට
රෙද්දක් බැහැ සේදීමට
මම අඬන්නේ මට ඇහෙන්න

විශාල මේ පොත් මිටියට
විවේකයක් නැහැ හරියට
හිරු මාමේ දවස් දෙකක්
එන්න එපා නිදන්න මට

(ලකුණු 10යි)

03. පද පූරණය කරන්න.

(i) පරඬැල් පෙඳ පුළුන් කෙඳි කට පිරෙන    තුරා
ගෙනැවිත් වියළි ගස්වල ඇති සුඹුලු    ඉරා

..............................................................................

..............................................................................

(ii) කිරි දරුවන්ගෙ බඩ පුරවන    අරමුණය

..............................................................................

ඇය මගෙ ගෙට එහා ගෙයි ඇති    එළදෙනය

..............................................................................

(iii) අධිවේගේ මාර්ගයෙන් අප යන කොට    සුවසේ
හිතුණේ මට අප රට දියුණුව ගැනමයි    මෙලෙසේ

..............................................................................

..............................................................................

(iv) නිවාසෙ පැරදුණයි කියල දුක් වෙන්නට එපා    මලේ
නිවාස කුටියෙන් අපි එක 'සමනලයා' අන්න    දිලේ

..............................................................................

..............................................................................

(v) සඳ රැසින්    නැහැවී
තුරුපත් සිනා    නැංවී

..............................................................................

..............................................................................

(ලකුණු 10යි)

04. පහත කවිපැනවලට එම විරිතින්ම පිළිතුරු සපයන්න.

(i) අනුන්ගේ වැරදි නිරතුරුවම    දකිමින්
තමන්ගේ වැරදි සඟවාගෙන    යහමින්
දනන් ගෙවන දිවියේ හිස්බව    කියමින්
කියන් ඔවදනක් ඔවුනට ගුණ    දහමින්

(ii) එදා මහ ජල කඳක් ගැලුවා විසල් මේ ගං හෝ    දිගේ
එයින් අටු කොටු සරු කළේ සා පවස නිවමින් හරි    අගේ
අද සිඳී ඇත ජලය නැත වියළී ගොසින් කඳුලැල්    නැගේ
දනෝ සිහි නොකරන්නෙ ඇයි අද ඒ මෙහෙය සෙත දුන්    ගඟේ

(iii) සුවඳයි හරි හැඩයි මේ සුදු    රෝසමල
දෙනුවන් සනසවයි පිය දසුනින්    නිමල
පුදුමයි ඒත් නටුවෙහි ඇති    විස විකල
කටු ඇයි රුඳුණෙ එහි ඇනුණොත් හිත    සසල

(iv) රුං ගාලා ඉගිලෙනවා කාපට් පාරවල්    දිගේ
පෙන්වාලා සමහරුන්ගෙ අවසානය ළඟයි    වගේ
දැන් වැඩිහිටි මාපිය දෙනුවන් අබියස කඳුළු    නැගේ
දෙන්නකො ඔවදනක් උනට කවියෙන් දූ පුතුනි    මගේ


(v) සිත් සැනසිලි සුව
තාලෙට කවියක්
අද දරුවන් හට
හේතුව මට කියල

ලබන්න
ගයන්න
අපහසු
දෙන්න

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

(ලකුණු 10යි)

05. පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කොට ඔබ සිතේ මැවෙන සංකල්ප කවියට නගන්න. පැදි 10 ට නොඅඩු විය යුතු ය. මාතෘකාවක්ද යොදන්න.



(ලකුණු 10යි)

## II කොටස

පහත දැක්වෙන 'අ' කොටසින් එකක් හෝ 'ආ' කොටසින් එකක් හෝ තෝරාගෙන පද්‍ය රචනාවක් ලියන්න. පද්‍ය 10 කට නොඅඩු විය යුතුය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) (i) ඉරක් පායනා දේශය - ලොවක් ලොබ බැඳුණු දේශය
මගේ මේ රටයි සුන්දර බලනු මැන සකී

(ii) මව් ඇති දාටත් සෙනෙහස පුදලා
මව් නැති දාටත් තුරුලේ රකිනා
සසර ගෙවෙන තුරු දරුවන් රකිනා
බුදු බව ලබනා පියවරු වෙසෙනා

(iii) වෙසක් කාලෙටයි කාගෙත් පින්කම්
කාට පේන්නද අනේ මන්දා

(iv) බුදුබණ කිව්වත් නිරන්තරේ
බුදුබණ ඇසුවත් නිරන්තරේ
ගතිගුණ අතින් අපි තවමත්
වනන්තරේ වනන්තරේ

(v) ශක්තිය බලපා යුක්තිය පාගා - පුහුමානය හද රන්දා
වස්තුව තිල බලතල හින්දා - මිනිසා මිනිසට දෙයි නින්දා

(ආ) ගුවන් විදුලිය හා රූපවාහිනිය අතර දෙබසක් පැදියෙන් ලියන්න. පද්‍ය දහයකට නොඅඩු විය යුතුය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

*නැතහොත්*

මහමග උද්ඝෝෂණයක් ඔබ දකින අයුරු පැදියෙන් ලියන්න. පද්‍ය දහයකට නොඅඩු විය යුතුය. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ලකුණු 50යි)

PAST PAPERS WIKI
(27) WWW.PastPapers.WiKi (27)